24

# ශ්‍රී ලාංකික මුස්ලිම් නායකයන් - II

# ආචාර්ය තුවාන් බුර්හානුද්දීන් ජායා



ශ්‍රී ලංකාවේ ශ්‍රීමත් සෙයියද් අහමඩ් කාන් (ද ක්‍රෙසන්ට්-1946) ලෙස ප්‍රසාදයට ලක් වූ ආචාර්ය ජායා, පොදුවේ ශ්‍රීලංකාවේ ද විශේෂයෙන් ම ශ්‍රී ලාංකික මුස්ලිම් ජනයාගේ අධ්‍යාපනික මෙන් ම දේශපාලනික ඉතිහාසයේ ද නොමැකෙන සටහන් තැබූ චරිතයක් ලෙස ප්‍රකට ය. මෙතුමාගේ සමාජ ජීවිතය විවිධ ක්ෂේත්‍ර ඔස්සේ විහිදේ.

තුවාන් බුර්හානුද්දීන් ජායා යන නම් ලත් මෙතුමා, මහනුවර ගලගෙදර ප්‍රදේශයේ දී 1890 දී උපත ලද්දේ ය. ගලගෙදර හා කුරුණෑගල ප්‍රදේශවල දී මෙතුමාගේ ළදරු විය ගතවිය. මේ වියේ දී ආලිම්වරුන්ගෙන් තම ආගමික අධ්‍යාපනය ලැබූ මෙතුමා ප්‍රාථමික අධ්‍යාපනය ලබා ගැනීමට මහනුවර ශාන්ත පාවුලු විදුහලට ඇතුළු වූවේ ය. ඉන්පසු ශිෂ්‍යත්වයක් ලබා කොටහේන ශාන්ත තෝමස් විදුහලට ඇතුළු වූවේ ය. පාසල් වියේ දක්ෂ ශිෂ්‍යයකු ලෙස ට නම් දරා සිටීමට විවිධ ක්ෂේත්‍රවල දැක්වූ හැකියාවන් හා ඒ සඳහා පිරිණමණු ලැබූ ත්‍යාග හේතු විය. ජේ. ඒ. සි.මෙන්ඩිස් ගණිත ත්‍යාගය, ආචාර්ය ඊ බෙල් ලතින් ත්‍යාගය, ක්‍රිස්ටෝපර් ඔබේසේකර බටහිර සාහිත්‍ය සඳහා වූ ප්‍රථම ස්ථානය පන්තියේ හොඳම ශිෂ්‍යයාට හිමි ත්‍යාගය එතුමා ලබාගත් ත්‍යාග අතුරින් කිහිපයකි.

පාසල් ජීවිතය අවසන් කළ ජායා 1910දී මහනුවර ධර්මරාජ විදුහලේ උප ගුරුවරයකු ලෙස තමන්ගේ මෙහෙවර ඇරඹුවේ ය. ඉන්පසු **Prince of Wales** විදුහලේ බටහිර සාහිත්‍ය ගුරුවරයකු ලෙස පත්වීම් ලබා එම විදුහලේ සේවය කළේ ය. මේ කාලවකවානුවේ ලන්ඩන් විශ්ව විද්‍යාල බාහිර විභාගයට පෙනී සිට 1916 දී කලා උපාධිධාරයකු ලෙසට පත්විය. 1917 දී ආනන්ද විදුහලේ ගුරුවරයකු ලෙස පත්වීම් ලද මොහු එහි බටහිර සාහිත්‍ය හා ඉතිහාසය යනා දී විෂය ඉගැන්නුවේ ය. නිතී ක්ෂේත්‍රයේ ජායා තුමාට තිබුණු ලැදියාව හේතුවෙන්

එතුමා නීතිවේදි ශිෂ්‍යයකු ලෙස ලියාපදිංචිවූව ද, ගුරු වෘත්තියට තම වැඩි කැමැත්ත දක්වී ය. මෙනිසා ලංකාවේ අධ්‍යාපන ඉතිහාසයේ "එක් අධ්‍යාපනඥයකු" ලෙස නොමැකෙන සටහනක් තැබීම ට ඔහු සමත් විය.

ආනන්ද විදුහලේ සේවය කිරීමෙන් අනතුරු ව මුස්ලිම් සමාජයේ අධ්‍යාපන මට්ට ම දියුණුකිරීම ට තම වෙහෙස වූවේ ය. ඔහුගේ කාර්යය විශිෂ්ඨ ලෙස ක්‍රියාත්මක කිරීමට ප්‍රින්ස් ඔෆ් වේල්ස්, ධර්මරාජ, ආනන්ද වැනි විදුහල්වල ලැබූ අත්දැකීම් සහයෝග විය. මෙතුමා ගුරු වෘත්තියට පිවිසීමට පෙර සිට ම මෙරට මුස්ලිම් ජනයාගේ අධ්‍යාපනය පිළිබඳඅධක උනන්දුවක් දක්වූයේ ය. මෙම කාලවකවානුවල ලංකා මුස්ලිම් සමාජය අධ්‍යාපන ක්ෂේත්‍රයේ පසුබෑමකට ලක් වී තිබුණා සේම සංස්කෘතික හා දේශපාලනික කටයුතුවල දී හුදෙකලා මෙන් ම ඉවතලණු ලැබ තිබුණි. මෙම අවාසනාවන්ත තත්ත්වය හඳුනාගත් ටී.බී. ජායා තුමා මෙයින් මුස්ලිම් සමාජය මුදවා ගැනීම උදෙසා මෙතුමා තම කථිකත්ව හා ලේඛණ හැකියාව උපයෝගී කර ගත්තේ ය.

තමාගේ සමාජයේ අධ්‍යාපන දියුණුව වෙනුවෙන් ජායා තුමාට තිබූ ලැදියාව පහත සඳහන් වන මොහුගේ කථාවේ කුඩා කොටසක් අයුරින් ඉදිරිපත් කළ හැක.

"අප සාක්ෂාත් කරගෙන ඇත්තේ කුමක් ද? අනෙකුත් ප්‍රජාවෝ, නීතිඥවරු, වෛද්‍යවරු, රාජ්‍ය සභා සභිකයින්, විද්වතුන් ලෙස බොහෝ දෙනා බිහි කර ඇත.අප අතර මෙවැන්නන් කීදෙනකු සිටී ද?"

ශ්‍රී ලාංකික මුස්ලිම් ජනයාගේ අධ්‍යාපනය පිළිබඳ උනන්දු වූ විද්වතුන් වන සිද්දි ලෙබ්බේ තුමාගේ සිහිනය මුදුන්පත් කර ගැනීමට වෙර දරූ පුද්ගලයකු ලෙස ට ජායා ප්‍රසිද්ධ ය. මෙතුමා ද සිද්දි ලෙබ්බේ තුමා මෙන් ම ඉංග්‍රීසි අධ්‍යාපනයේ වැදගත්කම හා එතුලින් අධ්‍යාපනික සමාජීය හා දේශපාලනික ක්ෂේත්‍ර වර්ධනය කළ හැකි යන මත දැරුවේ ය.

1921 වර්ෂයේ දී ජායා මැතිඳුන් සහිරා විදුහලේ විදුහල්පති ධූරයේ වැඩ භාර ගත්තේ ය. ගුරුවරු 6 දෙනකු හා ශිෂ්‍යයින් 59 කුගෙන් සමන් විත වූ විදුහලේ පියමන් භෞතික සම්පත් තිබුණේ නැත. විදුහලට අයිනව තිබූ එක ම ගොඩනැගිල්ල පවා රාත්‍රී කාලයේ දී ලැගුම්හලක් බවට පත්ව තිබුණි.

මෙවැනි ඉතා දුක්ඛිත තත්ත්වයක තිබූ සහිරා විදුහල දශක දෙකක කාලයක් තුළ දී එවක තිබුණු ආනන්ද, රාජකීය, ශාන්ත තෝමස් වැනි කීර්තිමත් විදුහල්වල මට්ටමට ජායා මැතිතුමා විසින් කඩිනම් වර්ධනයක් ඇති කළේ ය. මේ මගින් සහිරා විදුහල ට අවැසි සම්පත් දියුණු කිරීමට ඔහුට හැකි විය. 1924 දී පාසලට සුදුසු ක්‍රීඩා පිටියක් ගොඩ නැගුවේය. එන්.ඩී.එච්. අබ්දුල් ගෆූර් මහතාගේ අනුග්‍රහයෙන් ඉදිකරන ලද පාසල් ප්‍රධාන ශාලාව එකල ආණ්ඩුකාර ශ්‍රීමත් හර්බට් නැමැත්තා විසින් විවෘත කරන ලදි. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ද රටේ අනෙකුත් පාසල් මට්ටමට සහිරා ව දියුණු කළේ ය. මෙයට පාපන්දු, රග්බි, බොක්සිං සහ ක්‍රිකට් වැනි ක්‍රීඩාවන් හඳුන්වා දුන්නේ ය.

1930 දි ඇතිවුණු ආර්ථික පසුබෑම දෙවැනි ලෝක සංග්‍රාමය වැනි දේවල්වලින් ලාංකික මුස්ලිම් ජනතාවගේ අධ්‍යාපනයේ පසුබෑමත් ඇති වූව ද ඒවා දැක පසුබට නොවී සමාජ උන්නතිය තකා අඛණ්ඩ ව තමාගේ මෙහෙය කළේය. සංග්‍රාමයෙන් පසු ව කොළඹ විසූ මුස්ලිම් ජනයා පිටමන් කළා විතරක් නොව සහිරා විදුහල හමුදාවේ නේවාසිකාගාරයක් ලෙසට පත් විය. මේ කටුක තත්ත්වය රටේ අනෙකුත් දිස්ත්‍රික්කවල අධ්‍යාපනය ව්‍යාප්ත කිරීමට අවස්ථාවක් ලෙස භාවිත කර මෙහි ප්‍රතිඵලයක් ලෙස ගම්පල, අලුත්ගම, මාතලේ, පුත්තලම වැනි ස්ථානවල සහිරා විදුහලේ ශාඛා බිහිවුණි.

පෞරුෂ වර්ධනයේ දී දහමෙන් සිදුවන කර්තව්‍ය දැන සිටි ජායා ශිෂ්‍යයින් ආගමික පරිසරයක් තුළ හැදෑරිය යුතු යි, යන අවශ්‍යතාව අවධාරණය කළ අනෙකුත් ආගමික ප්‍රතිපත්තිවලට ගරුකරමින් ක්‍රියා කළ යුතු බවට සහජීවනය පිළිබඳ අදහස් තම කථාවල දී ඉදිරිපත් කළේ ය.

ආගමික පරිසරට තුළ ලබාදෙන අධ්‍යාපනය දේශානුරාගය, සමාජ සුභසිද්ධිය කෙරෙහි ලැදියාව, අවස්ථාව අහිමි අය කෙරෙහි වූ මහත් සැලකිල්ල යනාදිය ඇති කළ යුතු යි. අධ්‍යාපනය නිසි මග යන්නේ නම් රටක් ලෙස මුහුණපාන ගැටළු ඉතා සුලු කාලයේ දී විසඳිය හැකි යැයි සිතූ ජායා, ඒ වන තුරු ම ප්‍රතික්ෂේප වී තිබූ මුස්ලිම් ස්ත්‍රීන්ගේ අධ්‍යාපනය ගැන ද තම අවධානය යොමු කළේ ය. ගුරුවරුගේ සුබසිද්ධිය වෙනුවෙන් තම උපරිම සහය ලබා දුන්නේ ය. ගුරුවරුන්ගේ ආර්ථික දියුණුව බලාපොරොත්තු වූ ජායා සමස්ත ලංකා ගුරු සංගමයේ හා සමස්ත ලංකා පාසල් විදුහල්පති සංගමේ ද නායකයා ලෙස ද තෝරා පත් වූයේ ඔහුගේ බලාපොරොත්තුව ඉටු කර ගැනීමට කදිම අවස්ථාවක් සපයමිණි.

ජායා දේශපාලනයට ප්‍රවිශ්ට වූයේ 1924 වසරේ දීය. එම වසරේ දී ම ව්‍යවස්ථාදායක සභාවට තේරී පත් වූ ඔහු පොන්නම්බලම් රාමනාදන්, ජේම්ස් පීරිස් වැනි නායකයන් සමඟ ඉතා ලඟින් ආශ්‍රය කළේ ය. ලංකා ජාතික කොංග්‍රසයට එක් ව ජාතික නිදහස ලබා ගැනීම උදෙසා සිංහල හා දෙමළ නායකයන් සමඟ එකතු වී වැඩ කළේ ය. ව්‍යවස්ථාදායක සභාවේ හා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සාමාජිකයකු ලෙස සිටි කාලය තුළ විවිධ කමිටුවල හා කොමිසම්වල සාමාජිකයකු ලෙස කටයුතු කළේ ය. එතෙක් පැවති මුස්ලිම් විවාහ සහ දික්කසාද නීතිය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට මඟ පෙන්වි ය. සිංහල හා දෙමළ භාෂා රාජ්‍ය භාෂා ලෙසට පත් කිරීමේ ක්‍රියාවලියේ දී මෙතුමාගේ දයකත්වය සුවිශේෂි වේ.

මුස්ලිම් සමාජයේ සුභසිද්ධිය වෙනුවෙන් නිතරම අවදියෙන් සිටි ජායා, ජුම්මා සලාතය වෙනුවෙන් නිවාඩු ලබාදීම කෙරෙහි ද අවධානය යොමු කළේ ය. ව්‍යවස්ථාදායක සභාවේ දී ජාතීන් අනුව තිබූ කොට්ඨාස ක්‍රමය ඉවත් කර මුස්ලිම්වරුන්ටත් නියෝජනය ලබාදිය යුතු බවට බල කළේය.

ජායා තුමාට තිබූ පෘථුල සමාජ දැනුමට පහත සඳහන් පාඨ සාක්ෂි දරයි.

"මා දේශපාලන නිදහසට වඩා කිසිම අයිතිවාසිකමක් වැදගත් යැයි, සලකන්නේ නැත"

සමස්ත ලංකා මුස්ලිම් ලීගය සමඟ ද ජායා ඉතා සමීප සම්බන්ධතා ගොඩනඟා තිබුණි. ලාංකීය දේශපලනය තුළ මුස්ලිම් ප්‍රජාව නියෝජනය කිරීමේ ගෞරවය මුස්ලිම් ලීගයට අත් කර දුන්නේ ය. 1936 - 1947 කාලවකවානුවට අයත් මෙතුමාගේ දේශපාලනය ජීවිතය අප රටට ජාතික නිදහස ලබා ගැනීමට මංපෙත් විවර කළ කාල පරිච්ඡේදය වේ. ලංකාවේ ප්‍රථම අගමැති ඩී. ඇස්. සේනානායක මැති තුමාගේ ඇමති මණ්ඩලයෙහි කම්කරු කටයුතු ඇමති ලෙස තෝරා පත් විය.

1950 දී පාකිස්තානයේ ශ්‍රී ලංකාවේ මහ කොමසාරිස්වරයා ලෙස පත් වූ එතුමා පාකිස්ථානය බලා ගියේය. එහි තානාපතිවරුන්ගේ කණ්ඩායම් නායකයා ලෙස ද තේරී පත් වූවේ ය. එහි එතුමා කළ සේවාවය අගයනු වස් කරච්චි විශ්ව විද්‍යාලය ඔහුට ආචාර්ය උපාධිය පිරිනමා ගෞරව කළේය.




ආගමික ක්ෂේත්‍රයේ ද ජායා ඉමහත් ලැදියාවක් සහ සම්බන්ධතා ඇති අයකු වූයේ ය. ලංකාවේ සිට මක්කම බලා යන වන්දනාකරුවන්ගේ සුහසිද්ධිය තකා මක්කම නගරයේ නවාතැන් පොළක් ස්ථාපනය කිරීම සඳහා සාකච්ඡාවකට සහභාගීවීමට 1960දී සවුදි අරාබිය බලා ගියේ ය. එතුමාගේ කෙටි සංචාරයේ දී රෝගාතුර වීම නිසා 1960 මැයි මස 31 දින අභාප්‍රාප්ත වූවේ ය. එතුමාගේ ජානාසාව සවුදි අරාබි රජයේ රාජ්‍ය ගෞරවය සමඟ "ජන්නතුල් බකීහි" භූමදානය කරන ලදී.

එතුමාගේ අනුස්මරණයට ලාංකීක රජය 1981.05.31 වැනි දින තැපැල් මුද්දරයක් නිකුත් කර ගෞරව කළේය.

**අභ්‍යාසය**

1. ලංකා මුස්ලිම්වරුන්ගේ ප්‍රබෝධයේ පුරෝගාමියා ලෙස එතුමා මුස්ලිම් සමාජයට කළ සේවාවන් වගු ගත කරන්න.
2. ආචාර්ය්‍ය ජායා සහිරා විදුහලට කළ සේවාවන් කුමක්ද?
3. ආගමික පරිසරයේ ඉගෙනිම් යන ජායාගේ චින්තනයන් විග්‍රහ කරන්න.